# ලොව වටා පුවත් වියමන



අගෝස්තුව ලෝකයේ වෙසෙස් අවධානයට ලක්වූ සිදුවීම් බොහොමයක් යුද්ධයට සහ විනාශයට අදාළ සිදුවීම් ලෝ වැසි බහුතරයේ කණගාටුවට හේතුවූවාට සැකයක් නැත. මාසය ආරම්භ වන්නේ පොකුරු බෝම්බ නිෂ්පාදනය නවතා දැමීමට ලෝකයේ රටවල් 107 ක් ඇතිකර ගත් ගිවිසුම ක්‍රියාත්මකභාවයට පත්කරමිනි. ඒ අනුව 2010 අගෝස්තු 01 දා සිට ලෝකයේ රටවල් 107 ක් පොකුරු බෝම්බ නිෂ්පාදනය, ප්‍රවාහනය සහ භාවිතයෙන් වැළකී සිටිනු ඇත. එමගින් යුද ගැටුම්වලට මැදිවී සිටින සිවිල් වැසියන්ට සැළසෙන සහනය ඉමහත්ය. සතුරු පාර්ශ්වයන් වෙත ගුවනින් හෙළන පොකුරු බෝම්බ ක්‍රියාකාරීත්වය සෙසු බෝම්බවලින් වෙනස්ය. බෝම්බ පොළොවට වැටීමට පෙර පුපුරා ගොස් ඒ තුළ ඇති කුඩා බෝම්බ රාශියක් විශාල ප්‍රදේශයක් පුරා විසිරී යන අතර ඒවා පුපුරා යාම සිදුවන්නේ විවිධ අවස්ථාවල විවිධ තත්ත්වයන් යටතේය. ඇතැම් බෝම්බ වසර 15ක් 20ක් වැනි දීර්ඝ කාලයක් පුරා නිෂ්ක්‍රීයව තිබී හිටි අඩියේ පුපුරා යන අතර බොහෝවිට මෙවැනි පිපිරීම්වලින් විපතට පත්වන්නෝ යුද්ධයේ පාර්ශ්වකරුවන් නොවන බැවින් කාලයක් තිස්සේ ලොව පුරා පොකුරු බෝම්බ භාවිතයට එරෙහිව උස් හඬක් නැගෙමින් තිබිණ. පොකුරු බෝම්බ භාවිතය තහනම් කෙරෙන ගිවිසුම එහි ප්‍රතිඵලයකි. එහෙත් කණගාටුවට කරුණ නම් ලෝකයේ ලොකු කුඩා රටවල් 107 ක් අස්සන් කරනු ලැබූ මේ ගිවිසුමට ලෝක බලවතා වන ඇමරිකා එක්සත් ජනපදය සහ දෙවැනි පෙළ බලවතුන් වන චීනය රුසියාව යන රටවල් අස්සන් නොකිරීමය. ඇමරිකා එක්සත් ජනපදයේ දේශපාලන අනුග්‍රහය ලබන ඊශ්‍රායලයද ගිවිසුමට අස්සන් කිරීම ප්‍රතික්ශේප කළේය.

## ආරම්භක වෙඩි මුරය

උතුරු සහ දකුණු කොරියා දෙරට් අතර වසර ආරම්භයේ සිට ඉහළ නගිමින් තිබූ යුද උණුසුම තවදුරටත් ඉහළ නංවමින් උතුරු කොරියාව දකුණු කොරියාවේ ඉලක්ක කීපයකට ෂෙල් ප්‍රහාර එල්ල කරනු ලැබීම ඉකුත් මාසයේ යුද්ධයට අදාළව සිදුවූ තවත් වැදගත් සිදුවීමකි. දෙරට අතර යුද උණුසුමක් මෝදුවන්නේ මාර්තු 26 දා දකුණු කොරියාවට අයත් යුද නැවක් අභිරහස් ලෙස පිපිරී එහි සිටි නාවික හටයන් 46 දෙනෙකුද සමග මුහුදුබත් වීමත් ඒ සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂණයකින් පසු එය උතුරු කොරියාව විසින් සිදුකරන ලද්දක් බව ප්‍රකාශයට පත්වීමත් සමගිනි.



අනතුරුව දකුණු කොරියාව ඇමරිකාව සමග එක්ව නාවික අභ්‍යාස කිහිපයක්ම පැවැත්වූයේ සිය රටේ යුද ශක්තිය ප්‍රදර්ශණය කරමිනි. එම නාවික අභ්‍යාස සඳහා ඇමරිකා එක්සත් ජනපද නාවික හමුදාවේ යුද නැව්, ගුවන්යානා සහ හමුදා භටයෝ දස දහස් ගණනක්ද සම්බනධ වූහ. මේ යුද අභ්‍යාස සම්බන්ධයෙන් උතුරු කොරියාව සිය බලවත් විරෝධය ප්‍රකාශයට පත්කළ අතර අසල්වැසි රටක් වන චිනයද විරෝධය පළකළේ සිය රට ආසන්නයට ඇමරිකා යුද නැව් පැමිණීමෙන් තමන්ගේ ආරක්ෂාවටද මෙය තර්ජණයක් බව පවසමිනි. එහෙත් ඒ කිසිම විරෝධයකින් දකුණු කොරියාවේ සහ ඇමරිකාවේ ක්‍රියාපිළිවෙළ වෙනස්වූයේ නැත. ඒ වෙනුවනට ඇමරිකාව හා එක්ව තවත් මහා පරිමාණයේ නාවික අභ්‍යාසයක් පැවැත්වීමට දකුණු කොරියාව ක්‍රියාකළේය. එය පවත්වනු ලැබුවේ අගෝස්තු 16 සිට 26 දක්වාය. පරිඝණක ආශ්‍රිතව ක්‍රියාත්මක කෙරුණු එයට දකුණු කොරියා සෙබළු 50 000ක් සහ ඇමරිකා සෙබළු 30 000ක් පමණ සහභාගීවූහ. දැන් උතුරු දකුණු කොරියා අතර යුද්ධයේ ආරම්භක වෙඩි මුරය උතුරු කොරියාව දෙසින් දැල්වී හමාරය.

මෙලෙස ඇමරිකා එක්සත් ජනපදය කොරියාවේ යුද ගිනි දැල්වීමට ඔක්සිජන් සපයමින් සිටින්නේ වසර හතහමාරක් තිස්සේ ඉරාකයේ සිදුකළ යුද්ධයෙන් සිය හමුදා ඉවත්කරගනිමින් සිටින අතරදීය. ජීව විද්‍යාත්මක අවි ඇති බව කියමින් එවක ඇමරිකා ජනාධිපති ජෝර්ජ් බුෂ්ගේ නියමයෙන් ඇමරිකා හමුදා ඉරාකය ආක්‍රමණය කළ අතර ඉරාක ජනාධිපති සදාම් හුසේන් ඝාතනය කර තමන්ට අවනත පාලනයක් රට තුළ ගොඩනැගීමේ ප්‍රයත්නයක නියැළින. සදාම් හුසෙ-න්ගේ පාලනය අවසන් කරමින් සිය අභිලාෂය යම් තරමකින් සාර්ථක කර ගැනීමට ඇමරිකාව සමත්වුවද එහිදී එරටට සිදුකළ විනාශය අතිවිශාලය. ඔබාමා ජනාධිපතිවරණයට ඉදිරිපත්වෙමින් ජනතාවට ලබාදුන් මැතිවරණ පොරොන්දුවක් වූයේ ඉරාකය තුළ සිදුකරන ඇමරිකා හමුදා මෙහෙයුම් නවතා සිය සෙබළුන් ආපසු කැඳවන බවය. ඒ අනුව යමින් අගෝස්තු 30 දා ජාතිය අමතමින් ප්‍රකාශයක් කරමින් ජනාධිපති ඔබාමා ප්‍රකාශ කළේ ඉරාකයේ හමුදා මෙහෙයුම් නතර කරනු ලැබූ බවය. ඒ වන විටත් ඉරාකයේ සිටි ඇමරිකා හමුදා සෙබළුන් සංඛ්‍යාව 50 000 ක් පමණ වූ අතර එතැන් සිට යළි සිය රට කැඳවන තෙක් කඳවුරුතුළට වී සිටීමට ඔවුන්ට සිදුවනු ඇත. සිය කාර්ය භාරය අවසන් කර




ශ්‍රීලාල් සෙනෙවිරත්න

ඇමරිකා හමුදා ඉරාකයෙන් ඉවත්වීමට තීරණය කළද ඉරාකයේ භීම සමය තවමත් අවසන් වී නොමැත. තැනින් තැන පුපුරා යන මරාගෙන මැරෙන බෝම්බ තවදුරටත් ජීවිත සහ දේපොළ විනාශ කරති. අගෝස්තු 25 දා ඉරාකයේ ප්‍රධාන නගර හතක මරාගෙන මැරෙන ප්‍රහාර එල්ල කෙරුණේ ඉතා සැළසුම් සහගතවය. ඒ ප්‍රහාරවලට ගොදුරුව පුද්ගලයන් හැටදෙනෙක් පමණ ජීවිතක්ෂයට පත්වූ අතර අඩුතරමින් තුන්සිය දෙනෙකුවත් තුවාල ලැබූහ. අගෝස්තු 17දා ඉරාකයේ හමුදා සෙබළු බඳවා ගන්නා ස්ථානයකට එල්ල වූ මරාගෙන මැරෙන ප්‍රහාරයකි-න් 59 දෙනෙකු ජීවිතක්ෂයට පත්ව 109 දෙනෙකු පමණ තුවාල ලැබූහ. තත්ත්වය එසේ තිබියදී ඇමරිකාව පවසන්නේ දැන් තත්ත්වය තිබුණාට වඩා යහපත් බවත් ඉදිරියේදී සාමාන්‍ය තත්ත්වයට පත්වණු ඇති බවත්ය. ආරක්ෂාව සම්බන්ධයෙන් ඉරාකය මුහුණ දී සිටින අස්ථාවරභාවයට සමාන දේශපාලන අස්ථෘවරභාවයකටද එරට මුහුණ දී සිටින්නේ මහ මැතිවරණය පවත්වා මාස හයක් ඉක්ම ගිය පසුත් නව ආණ්ඩුවක් පිහිටුවා ගැනීමට එරට අසමත්වීම හේතුවෙනි. මහ මැතිවරණයෙන් කිසිදු පක්ෂයකට තනිව ආණ්ඩුවක් පිහිටුවීමට ප්‍රමාණවත් ආසන ප්‍රමාණයක් හිමි නොවූ අතර සන්ධාන ආණ්ඩුවක් සඳහා වන එකගතාවක් ඇතිකර ගැනීමටද මැතිවරණයට තරඟ කළ පාර්ශ්වයන් මෙතෙක් සමත්ව නැත.

## න්‍යෂ්ඨික අවතාර

එක් අතකින් ඉරාකයේ සිය හමුදා මෙහෙයුම් හමාර කරන ඇමරිකාව අනෙක් අතින් උතුරු කොරියාවට මෙන්ම ඉරානයට එරෙහිවද නොනිල වශයෙන් යුද ප්‍රකාශ කරමින් සිටී. ඇමරිකාවේ දැඩි බලපෑම් මත ඉරානයට එරෙහිව මේ වන විට සම්බාධක රාශියක් පනවා අති අතර ඒ හේතුවෙන් දැනටමත් එරට ආර්ථික අර්බුධයකට මුහුණ දෙමින් සිටී. එහෙත් ඉරාන ජනාධිපති අහමදිනේජාඩ් සිටින්නේ කවර තත්ත්වයක් යටතේ වුවද ඇමරිකාවේ අවශ්‍යතාව පරිදි යුරේනියම් බලගැන්වීමේ සිය න්‍යෂ්ඨික වැඩපිළිවෙළ නතර නොකරන ස්ථාවරයකය. ඉරානය න්‍යෂ්ඨික බෝම්බයක් නිෂ්පාදනය කරමින් සිටින බවද එය ලෝක සාමයට ඉතා නරක ආකාරයෙන් බලපානු ඇතැයිද ඇමරිකාව



දිගින් දිගටම උස් හඬක් නැගුවද ඒ චෝදනා ප්‍රතික්ශේප කරන ඉරානය පවසන්නේ සිය න්‍යෂ්ඨික වැඩපිළිවෙළේ අරමුණ බලශක්ති අර්බුධයට විසඳුම් සෙවීම බවය. රුසියාවේ ආධාරයෙන් ඉරානයේ ඉදිකෙරුණු ප්‍රථම න්‍යෂ්ඨික බලාගාරය අගෝස්තු 21 දා විවෘත වන්නේ එවන් පසුබිමකය. බලශක්තිය නිපදවීම සඳහා ඉරා-නයට බලාගාරයක් ගොඩනැගීමට සහාය පළකරමින් දෙරට න්‍යෂ්ඨික න්‍යෂ්ඨික බලශක්ති හුවමාරුකරගැනීමේ ගිවිසුමකට අස්සන් තබන්ෙ-න් 1995 වසරේදීය. එහෙත් ඉරානයට එරෙහිව වරින් වර පැනවුණු සම්බාධක හේතුවෙන් මෙහි ඉදිකිරීම් කටයුතු දිනෙන් දින පමාවිය. ඉකුත් ජුනි මාසයේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය ඉරානයට එරෙහිව සම්බාධක පනවන අවස්ථාවේ රුසියාව පවා ඡන්දය පාවිච්චි කර තිබුණේ ඊට සහාය පළ කරමිනි.

අද ඉරානයේ න්‍යෂ්ඨික බෝම්බ නිපදවීමක් ගැන මහත් සන්තාපයකින් කතාකරන ඇමරිකාව න්‍යෂ්ටික බෝම්බ ප්‍රහාර එල්ල කර ලෝකයේ මහා මිනිස් සංහාරය සිදුකර හැටපස් වසරක් සම්පූර්ණ වූයේ අගෝස්තු 06 වෙනිදාය. දෙවන ලෝක යුද්ධයේදී ප්‍රථම වරට න්‍යෂ්ඨික බෝම්බ යොදාගනිමින් ජපානයට ප්‍රහාරයක් එල්ල කළේ 1945 අගෝස්තු 06 දින පෙරවරුවේය. එම ප්‍රහාරයෙන් හිරෝෂිමා නගරය නටබුන් බවට පත්වූයේ මිනිසුන් එක්ලක්ෂ හතලිස් දහසක් මරණයට පත්කරමිනි. එම ප්‍රහාරයෙන් දෙදිනකට පසු දෙවන වරට ජපානයේ නාගසාකි ප්‍රදේශයටද න්‍යෂ්ඨික බෝම්බ ප්‍රහාරයක් එල්ල කෙරුණු අතර ඉන් ඒ ප්‍රදේශයද සුන්බුන් ගොඩක් බවට පත්වූයේ හැත්තෑදහසකට මරු කැඳවමිනි. මේ සිදුවීම් අනුස්මරණය කෙරෙමින් වාර්ෂිකව ජපානයේ පැවැත්වෙන සමරුවට මෙවර ප්‍රථම වතාවට ඇමරිකාවටද ආරාධනය කර තිබිණ. .

## සපත්තු පාර දිගේ...

වසර කීපයකට පෙර ඉරාකයේදී නව සපත්තු පාරක් විවෘත කෙරුණේ එවක ඇමරිකා ජනාධිපති ජෝර්ජ් බුෂ් සහභාගී වූ මාධ්‍ය හමුවකදී ඊට සහභාගී වූ මාධ්‍යවේදියෙකුගේ අතිනි. එදා විවෘත කෙරුණු මේ සපත්තු පාර පසුව විවිධ රටවල් ඔස්සේ ඉදිරියට ගමන් කරන්නට පටන් ගත්තේ දේශපාලන නායකයන්ගේ සහභාගීත්වය ඇතිවය. ඉකුත් මාසයේ තවත් රාජ්‍ය නායකයෙකු සහ ප්‍රාන්ත නායකයෙකු සපත්තු පාරට මුහුණ දුන්නේ අනපේක්ෂිත ආකාරයෙනි. රාජ්‍ය නායකයා පාක-ිස්තාන ජනාධිපති අසීෆ් අලි සර්දාරිය. ප්‍රාන්ත නායකයා අසල්වැසි ඉන්දීයාවේ ඉන්දු-කාශ්මීර මහ ඇමැති ඕමාර් අබ්දුල්ලාය. පාකිස්තාය දරුණු ස්වාභාවික විපතකට මුහුණදී ලක්ෂ ගණනක් විපතට පත්ව සිටින අවස්ථාවක විදේශ චාරිකාවක නිරත වූ ජනාධිපති සර්දාර්ට අගෝස්තු 04දා බ්‍රිතාන්‍යයේදී සපත්තු පහරක් එල්ල කළේ එරට වෙසෙන පාකිස්තාන ඩයස්පෝරාවේ සාමාජිකයෙකි. ඒ රෝමය ගිනි ගනිද්දී නීරෝ වීණා වාදනය කළා සම වූ ජනාධිපතිවරයාගේ විදෙස් සංච-ාරයට විරෝධය පළකිරීමක් වශයෙනි. අගෝස්තුව ආරම්භයේ සිටම පාකිස්තානයට ඇද හැලෙන ධාරාණිපාත වර්ෂාව හේතුවෙන් ඇතිවූ ගංවතුර සැළකෙන්නේ ඉතිහාසයේ එරට මුහුණදුන් දරුණුතම ස්වාභාවික විපත ලෙසටය. එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා පවසා තිබුණේ එමගින් සිදුවූ හානිය සුනාමියෙන් සිදුවූ හානියටත් වැඩි බවය. වයඹ දිග පාකිස්තානය දකුණු පන්ජාබය බලුකිස්තානය ඇතුළුව පාකිස්තාන භූමියෙන් පහෙන් එකක් ගංවතුරට ගොදුරුව සෝදාගෙන ගියේය. දෙදහසට ආසන්න පිරිසක් ජීවිතක්ෂයට පත්වූ අතර නිවාස ලක්ෂ ගණනක් සහ වගා බිම් අක්කර මිලියන ගණනක් විනාශයට පත්විය. සති දෙකක පමණ කාලයක් එක දිගට බලපැවැත්වූ මේ ගංවතුර ව්‍යසනයෙන් පසු එරට බලවත් අර්බුධයකට මුහුණ දී සිටින අතර වසංගත රෝග රට ආක්‍රමණය කරමින් පවතියි. පාක-ිස්තානු ජනාධිපතිවරයා දින කීපයක විදෙස් චාරිකා-වක නිරත වන්නේ ගංවතුරට මැදිව එරට ලක්ෂ ගණනක් ජනයා ජීවිතයත් මරණයත් අතර සටනක නිරතව සිටි අවස්ථාවකය.

ඉන්දු කාශ්මීර මහ ඇමැති අබ්දුල්ලාට මුහුණ දෙන්නට සිදුවුණේ නිකන්ම නිකන් සපත්තු පාරකට නොව පොලිස් බූට් පහරකටය. ඒ අගෝස්තු 15දාට යෙදී තිබුණු ඉන්දියාවේ 63 වැනි නිදහස් දින සැමරුම සඳහා ඉන්දු-කාශ්මීර ප්‍රාන්තයේ ශ්‍රී නගර් අගනුවර පැවැති සමරු උළෙළේදීය. මහ ඇමැතිවරයා ඉන්දීය ධජය ඔසවමින් සිටියදී ඔහු වෙතට පියාඹා ආ පොලිස් සපත්තුවේ හිමිකරුවා වූයේ අබ්දුල්ලා ජාන් නමැති පොලිස් නිලධාරියාය. පසුව එම නිලධාරියා සිය නිල නිවෙසට කැඳවූ මහ ඇමැතිවරයා ඔහුගේ



සුව දුක් විමසා තේ පැන් සංග්‍රහයක්ද පවත්වා වරදට සමාව ප්‍රදානය කිරීම සුවිශේෂී සිදුවීමක් වන්නේ මේ දක්වා සපත්තු ප්‍රහාරකයන්ට අත්වූ ඉරණම ඊට වඩා වෙනස් වූ එකක් වන බැවිනි.

## වැහි නැති හෙන

හෙන වැදීම හෙවත් අකුණු සැර වැදීම අතීතයේ අපි සැළකුවේ බලවත් කර්ම විපාකයක් වශයෙනි. 'හෙන ගහපන්' යනුවෙන් ශාප කිරීමද අතීතයේ පමණක් නොව අදටත් අපේ සමාජයේදී නොයෙක් විට අපිට අත්දකින්නට ලැබේ. ගස් ගල්වලට මෙන්ම මිනිසුන්ද ඇතුළුව සතා සීපාවන්ටද හෙන ගහපු කතන්දර අපි කොතෙකුත් අසා ඇතත් ගුවන් යානයකට හෙන ගහපු කතා නම් අපට අසා පුරුදු නැත. අගෝස්තු 16 දා ගුවන් යානයකට හෙන ගැසූ කතාව අපට අසන්නට ලැබුණේ කොළොම්බියාවෙනි. හෙන වැදී තිබුණේ බෝයිං 737 වර්ගයේ මගී ගුවන් යානයකටය. මගීන් සහ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් 131 දෙනෙකු සමග කොළොම්බියාවේ බොගෝටා නුවර ජාත්‍යන්තර ගුවන් තොටුපොළොන් 16 දා රාත්‍රියේ ගමන් ඇරඹූ යානය මීටර් 80 ක් ඉහළ අහසේදී අකුණු කුණාටුවකට මැදිවීමෙන් පසු ගුවන් නියමුවන් යානය කැරිබියන්හි සැන් ආන්ද්‍රේස් දූපතේ පිහිටි කුඩා ගුවන් තොටුපොළකට ගොඩබස්සන්නට ක්‍රියාකළේ මහත් පරිශ්‍රමයක් දරමිනි. එහෙත් අකුණු සැර වැදීමෙන් හානියට පත්ව තිබූ ගුවන්යානය ගොඩබස්සන අවස්ථාවේ ධාවන පථයේ වැදී කැබලි කීපයකට කැඩී ගියේය. යානයේ ගමන් ගත් 120 දෙනෙකු මෙම අනතුරෙන් තුවාල ලැබූ අතර 73 වියැති කාන්තාවක් සිද්ධියෙන් ඇතිවූ කම්පනයෙන් පසුව මිය ගියේය. ගුවන් අනතුරකට ලක්වන යානයක සිටින මගීන් මේ ආකාරයෙන් දිවි බේරාගන්නේ ඉතා කලාතුරකිනි. ගුවන්යානාවලට හෙන වදින කතා අපට ආගන්තුක වුවද සෑම පියාසර වාර දහසකට වරක්වත් ගුවන් යානයකට අකුණු සැර වදින බවත් එය යානයේ ගමන් ගන්නා අයට නොදැනෙන බවත් තාක්ෂණ. විද්‍යාඥයෝ පෙන්වාදෙති. බොහෝ විට යානයේ පියාපත් කෙළවරට වදින අකුණු සැරය යානයේ පිටත ලෝහ තහඩුව ඔස්සේ ඇදීගොස් වල්ගයෙන් නැවත වායු ගෝලයට එක්වන බව පවසන ඔවුහු මේ හෙන

42 වන පිටට